# බැද්දේගම නවකතාව පිළිබඳ විග්‍රහයක්

**කුසුම් හේරත්**

The novel “Baddegama" is a translation of the “Villgae in the jungle" written by the English writer Lenard Wolf. A. P. Gunarathne is the translator of this novel. The novel describes the historical reality of society in remote villages in Sri Lanka during the colonial rule. The writer has taken a good attempt in selecting the characters and incidents in suitable way in order to to achieve the target of developing the story of the novel. The reality of the characters have caused to the success of the novel.

බැද්දේගම **The Village in the Jungle** නමැති ඉංග්‍රිසි නවකතාවේ පරිවර්තනයකි. පරිවර්තනයක් වුව ද මුල් කෘතිය අබිබවා යන තරමට සාර්ථකත්වයක් ළඟා කර ගත් නිර්මාණයකි. එයට හේතුව සෑම පරිවර්තන කෘතියක ම සෑහෙන තරම් ස්වතන්ත්‍රතාවක් තිබිය හැකි හෙයිනි. කිසියම් ලේඛකයෙකු විසින් සකස් කරන ලද නිර්මාණයක කල්පිත අදහස් තිබිය හැකි ය. එම නිර්මාණකරුවාගේ අභිමතාර්ථ හා අනුභූතීන් මෙන් ම පුරුෂාර්ථ හඳුනාගන්නා පරිවර්තකයා ඉක්බිති ව එහි ප්‍රතිනිර්මාණයක් කරයි. පරිවර්තන බසෙහි ස්වතන්ත්‍ර ලක්ෂණ පළ කළ යුතු වන්නේ මුල් කෘතියේ වූ අනුභූතීන් පරිවර්තන කෘතියේ ද ඇති කිරීමෙනි. ඒ අතින් බැද්දේගම විශිෂ්ට කෘතියක් බවට පත් වන්නේ පරිවර්තන කාර්යයේ දී පරිවර්තකයා විසින් අනුගමනය කරන ලද ක්‍රමෝපායයන් හේතුවෙනි.

ලාංකේය සමාජය පසුබිම් කර ගෙන ඉංග්‍රිසි භාෂාවෙන් ලියැවුණු කෘතීන් කීපයක පරිවර්තන දැකිය හැකි ය. ඒ අතුරින් බැද්දේගම, වන සරණිය ආදි කෘති විශිෂ්ට ගණයේ නිර්මාණ ලෙස හඳුනාගත

© ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කුසුම් හේරත්

සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාර්ය දිනලි ප්‍රනාන්දු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අංජලී වික්‍රමසිංහ

මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 21 කලාපය, 2014/2015 මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

හැකි ය. ස්වතන්ත්‍ර රචනයක නියායෙන් රසතාවක් සහිත ව එම පසුබිමට ම ගැලපෙන පරිදි පරිවර්තන කාර්යය සිදු කොට ඇති හෙයින් මුල් කෘතියේ විෂය භූමිය, ගුරු අරුත් හා අත්දැකීම් එලෙස ම සිංහල පරිවර්තකයාට ද ග්‍රහණය කොට ගත හැකි වී ඇත. විශ්ව සාධාරණ මිනුම් දණ්ඩකින් නිර්මාණ සාහිත්‍යයෙහි අගය මනින්නටත් උසස් සාහිත්‍ය රුචියක් ඇති කරන්නටත් දේශීය සාහිත්‍යයේ අභිවර්ධනය උදෙසාත් පරිවර්තන සාහිත්‍යයෙන් ලැබෙන පිටුබලය සුළුපටු නොවේ. දේශීය නිර්මාණයක ඇති ගුණාත්මකභාවය පරිවර්තනයක නැතැයි සිතුව ද නිර්මාණ කාර්යයෙහි ලා විහිෂ්ටතාවට උපකාරී වන සාහිත්‍යාංගයක් ලෙස පරිවර්තන සාහිත්‍යය අගය කළ හැකි ය. ඒ මගින් පාඨක රසඥතාව දියුණු කර ගැනීමට ද හැකියාවක් ලැබේ. බැද්දේගම නවකතාව පිළිබඳ ව විවිධ මතිමතාන්තර නිර්මාණය වී ඇගයීමට භාජනය වී ඇත්තේ එම කෘතියෙහි ඇති විශිෂ්ටතා කීපයක් හේතුවෙනි. ඉංග්‍රිසි බසින් ලියැවුණු මෙම කෘතිය පිළිබඳ ව වූ මත අතර ''වුල්ෆ් මහතා අමරණීය කතාවක් ලියා තිබේ. ප්‍රබන්ධ කතාවන්ගෙන් සිදු විය හැකි උසස් සේවයට මෙය කදිම නිදසුනකි'' යනුවෙන් ලන්ඩන් ටයිම්ස් පුවත්පතේ පළවූ මතය ද සැලකිල්ලට ගත හැකි ය.

යටත්විජිතවාදි පාලන තන්ත්‍රය යටතේ ශ්‍රී ලාංකේය නොදියුණු ගැමි සමාජය හා බැඳී පැවතුණු ඓතිහාසික සත්‍යය පසුබිම් කොට ගෙන ගොඩනඟන ලද කල්පිතයක් ලෙස බැද්දේගම නවකතාව හැඳින්විය හැකි ය. ස්වකීය පරමාර්ථයන්ට අනුකූල වන සේ චරිත මෙන් ම සිද්ධි සංකලනය කරමින් ගොඩනඟාගත් කතා වින්‍යාසයක් මෙහි දක්නට ලැබේ. මනා තර්කානුකූල හේතු- ඵල සම්බන්ධතාවක් ඇති වන පරිදි සිද්ධි ගැලපීම හේතුවෙන් මතු කෙරෙන භව්‍ය ස්වභාවය පදනම් කර ගෙන කතාපුවත විශ්වසනීයත්වයෙන් ඉදිරිපත් වී ඇත. මෙම ලේඛකයා ස්වකීය අත්දැකීම වඩාත් ප්‍රබල ලෙස ඉදිරිපත් කිරීමට සුදුසු වන ආකාරයෙන් පුද්ගල, සමාජ හා සංස්කෘතික අංගයන් මනාව හඳුනාගෙන තිබේ. ඒ අනුව නවකතාකරුවා එකී සියලු අංග වඩාත් කලාත්මක අන්දමින් සංයෝජනය කරයි. නූගත් සාම්ප්‍රදායික ගැමි ජනතාව ඔවුන් පාලනය කිරීම සඳහා ඉදිරිපත් වන මුලාදෑනි පැලැන්තිය හා ගැමියන් උපයන සියල්ල සූරා කෑමට නගරයෙන් ගමට පැමිණෙන වෙළඳ බලවේගය යන අංශයන් අතර ඇති කෙරෙන ජීවන අරගලය මෙන් ම මෙකී

පසුබිම නිසා ඇති වන ගැටලුකාරී තත්ත්වයන් විසඳීමට ඉදිරිපත් වන යටත්විජිත පාලන තන්ත්‍රයට රුකුල් දෙන නිලධාරීන් යන අංශ අතර ඇති වන විසංයෝගය සහ ප්‍රතිවිරෝධය නවකතාකරුවා අපූර්වත්වයකින් යුතු ව ප්‍රතිනිර්මාණය කොට ඇත.

බැද්දේගම නවකතාව තත්කාලීන යථාර්ථය නිරූපණය කෙරෙන සාර්ථක නවකතාවක් ලෙස විග්‍රහ කළ හැකි ය. ඒ මගින් නවකතාකරුවා අපේක්ෂා කළේ අධිරාජ්‍යවාදි පාලන ක්‍රමයෙහි පැවති දුර්වලතා අනාවරණය කිරීමටයි. ඒ සඳහා කතුවරයා පීඩනයට පත් ජන ජීවිතය විෂයයෙහි සානුකම්පිත දෘෂ්ටියක් හෙළීමට යත්න දරයි. බැද්දේගම වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම බැද්දේ පිහිටි පිටිසර ගමකි. ඒ බව නවකතාව ආරම්භයේ සිදු කරන පසුබිම් විස්තරයෙන් තහවුරු වෙයි.

> ''මහ මුහුදටත්, කඳුවැටිවලටත් අතර පහතරට තැනිතලා ප්‍රදේශයක පිහිටි ගමකි බැද්දේගම. ඒ අවටින් වූයේ ඝන කැලෑවකි. මෙසේ කැලෑවට බැද්දට මැදි ව පිහිටි හෙයින් ඒ ගමට බැද්දේගම යන නම ඉබේම ඇති වූවකි. මහ මුහුදක් සේ පෙනුණු ගම වටා පිහිටි වන රොද නිසා ඇත උතුරෙන් වූ කඳුවැටි උස් වූ පඳුරු බිතක සිරිය ඉඳුරා පළ කළේ ය. උණුසුම් වාතය ද දූවිලි ද වියළී පොඩි වී ගිය දඬුපත් ද පිසගෙන ආ වනගඳ ගම පුරා පැතිර ගියේ ය.''[1]

නවකතාකරුවා ඉතා අපූරු වර්ණනයක නිරත වෙමින් බැද්දේගම පිළිබඳ අප සිත්හි චිත්තරූප මැවීමට සමත් ව ඇත. එබඳු පරිසරයක පිහිටි බැද්දේගමට අධිරාජ්‍යවාදි පාලනයේ හස්තය කෙසේ දිගු වී ද[2] එකී හස්තය දිගු වූ පහළ ම පාලන ඒකකය ලෙස සැලකෙන මුලාදෑනි පැළැන්තිය කෙසේ ක්‍රියාත්මක වී ද? යන කරුණු ඉතා ගැඹුරු ලෙස විග්‍රහ කිරීමට නවකතාකරුවා අවස්ථාව සලසා ගනියි. බැද්දේගම නවකතාකරුවාගේ පරමාර්ථය වූයේ අධිරාජ්‍යවාදි පාලන ක්‍රමය ගමට ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ගමක විනාශය සිදු වූ ආකාරය විග්‍රහ කිරීමයි. ඒ සඳහා සුදුසු කතාපුවතක් තෝරා ගැනීම නවකතාවේ සාර්ථකත්වයට හේතු වී ඇත.

බැද්දේගම යථාර්ථවාදී නවකතාවකි. ජීවිත විවරණය අභිප්‍රේත කර ගෙන සම්පාදනය කෙරෙන නවකතාවේ මූලික ලක්ෂණයක්

වන යථාර්ථ නිරූපණය යන්නෙන් අදහස් වනුයේ මිනිස් ජීවිත යථාර්ථය සත්‍ය ලෙස අව්‍යාජ ව නිරූපණය කිරීමයි. මෙයින් අදහස් වනුයේ ජීවිතය ඇති සැටියෙන් ම හෙවත් තාත්වික ව නිරූපණය කිරීමට වඩා මිනිස් ජීවිතයේ යථා අර්ථය හෙවත් නියම අර්ථය නිරූපණය කිරීම ය. යථාර්ථ නිරූපණයෙහි ලා ලේඛකයා අතින් සිදු වන්නේ යථා තත්ත්වය පිළිබඳ ස්වකීය ප්‍රතික්‍රියා දැක්වීමයි[2] යනුවෙන් වූ අදහස මගින් ද නවකතාවක යථාර්ථ නිරූපණය පිළිබඳ ව අවබෝධයක් ලබා ගත හැකි ය. යථාර්ථ නිරූපණය හා සම්බන්ධ ව පොදු ආකල්පයක් පැවතිය ද එය එක් එක් ලේඛකයා හා එක් එක් රටවල පවත්නා අදහස් අනුව වෙනස් විය හැකි ය. කෙසේ වුව ද **බැද්දේගම** යථාර්ථවාදි නවකතාවක් ලෙස විග්‍රහ කිරීමට සාධක පවතී. තත්කාලීන සමාජ යථාර්ථය ගැඹුරින් විග්‍රහ කිරීමේ දී නවකතාකරුවා එහි නිරූපිත චරිත, පරිසරය සමඟ ඓන්ද්‍රීය ව සම්බන්ධ කර ගනියි.

නවකතාවේ ඇතුළත් චරිත, ස්තර කිහිපයක් නියෝජනය කරයි. පළමුවැන්න නම් ගමේ ජීවත් වන විවිධ දුර්වලකම්, අන්ධ විශ්වාස සහ දැඩි ආත්මාර්ථය, පරාර්ථය, සත්භාවය, අවංකත්වය ආදියෙන් සමන්විත ගැමි ජීවිතයයි. මෙම ජීවිත ඉතා දුක්ඛිත තත්වයකට පත් වූයේ අධිරාජ්‍යවාදීන්ගේ අදූරදර්ශී අයහපත් පාලන ක්‍රමය ක්‍රියාත්මක කළ පාලකයන්ගේ ක්‍රියාකලාපය හේතුවෙනි. **බැද්දේගම** ගම විනාශය කරා ගමන් කිරීමේ දී ක්‍රියාත්මක වූ ප්‍රධාන බලවේගය වූයේ අධිරාජ්‍යවාදි පාලන ඒකකයේ පහළ ම ස්තරය වූ ආරච්චිලගේ මැදිහත් වීමයි. ගැමි ජීවිත කතාන්තරයේ දී ඊළඟ ප්‍රධාන බලවේගය වූයේ වෙළඳ බලවේගයයි. ආරච්චිලගේ මඟ පෙන්වීම මත ගමට පැමිණි ප්‍රනාන්දු මුදලාලි ගමේ වූ එකමුතුකම විනාශ කරමින් ඔවුනොවුන් අතර අසමගිය වපුරවා විනාශයට මඟ පාදයි. තුන්වන බලවේගය ලෙස නවකතාකරුවා මතු කරන්නේ බ්‍රිතාන්‍ය පාලනය සහ එකී පාලනය සඳහා සහාය දෙමින් නීතිය මෙහෙය වූ පුද්ගලයන් ය. දේශීය පාලන ක්ෂේත්‍රයෙහි ක්‍රියාත්මක වූ ආරච්චිල සහ රටේ මහත්තයා වැනි පුද්ගලයන්ට වඩා **බැද්දේගම** නුගත් ජනතාවගේ ප්‍රශ්න දෙස සානුකම්පිත දෘෂ්ටියක් හෙළීමට මහේස්ත්‍රාත්වරයා සහ ප්‍රධාන නඩුකාරතුමා සමත් වීම මගින් තත්කාලීන සමාජ යථාර්ථය හා පුද්ගල යථාර්ථය හෙළි වෙයි.

නවකතාකරුවා බැද්දේගම නවකතාව මගින් තත්කාලීන සමාජ යථාර්ථය නිරූපණය කිරීමේ දී සොබාදහම නමැති බලවේගය විසින් බැද්දේගම මිනිසුන්ගේ ජීවිතවලට සිදු කෙරෙන බලපෑම ද මතුවේ. අව්ව, වැස්ස, වසන්ගත නිසාත් ස්වභාවයෙන් ම නිර්මාණය වී ඇති ගම අවට වනය නිසාත් මෙම මිනිස් ජීවිත දැඩි සේ පීඩාවට පත් වෙයි. මෙම බලවේග හතරේ ක්‍රියාකාරීත්වය යථාර්ථවාදි ලෙස විවරණය කිරීමේ දී තත්කාලීන ලංකා සමාජය අපූර්ව ලෙස ප්‍රතිනිර්මාණය වී ඇත.

පහත සඳහන් ප්‍රකාශයන්ගෙන් ද මේ බව පැහැදිලි වේ.

> ''බැද්දේගම වූ කලි ලංකාවේ ඈත කැලෑ පෙදෙසක පිහිටි ගමක මිනිසුන්ගේ ජීවිතය පැහැදිලි ලෙස ද තත්ත්වාකාරයෙන් ද විස්තර කරන කතා ප්‍රවෘත්තියකි.''[3]

ගැමි මිනිසුන්ගේ ජීවිතවල පවත්නා කටුකත්වය සමාජය ඉදිරියේ මතුවන්නේ ඉතා කලාතුරකිනි. නිර්මාණ මගින් ඇතැම් විට කලාකරුවා පවා මතු කරන්නේ සැබෑ යථාර්ථය ම නොවේ. එහෙත් බැද්දේගම නිර්මාණකරුවා ඉංග්‍රිසි ජාතිකයකු වුව ද එකී ජීවිත යථාර්ථය මෙන් ම සමාජ යථාර්ථය ද තත්ත්වාකාරයෙන් හඳුනා ගැනීමට සමත් වෙයි. හම්බන්තොට ප්‍රදේශයේ පිහිටි ඈත පිටිසර ගමක මිනිසුන්ගේ ජීවිත ඒ සඳහා තෝරා ගන්නේ එහෙයිනි.

ලෙනාඩ් වුල්ෆ් විසින් මෙම කෘතිය නිර්මාණයෙහිලා යොදා ගන්නා ලද ක්‍රමෝපායයන්ට වඩා පරිවර්තන කාර්යයේ දී පරිවර්තකයා කතුවරයාට පසුබිම් වූ සමාජය විෂයයෙහි සවිඥානක වන අයුරු සිත්ගන්නා සුලු ය.

මෙම කෘතියෙහි විශේෂත්වය වන්නේ ලංකාවේ ජන ජීවිතය පිළිබඳ ව විදේශිකයකු විසින් හෙළන ලද දෘෂ්ටියයි. කෘතිය පරිවර්තනයේ දී පරිවර්තකයාට ලේඛකයා හා භාෂාව විජාතික වුව ද කෘතියේ නිරූපිත සමාජය, චරිත, සිද්ධි ආදිය ස්වකීය දේශය සමාජය හා සංස්කෘතිය සමඟ බද්ධ වීම වැදගත් සාධකයකි. එබැවින් පරිවර්තකයාට කෘතියේ නිරීක්ෂකයා ස්පර්ෂ කළ තැන් පහසුවෙන් හසු කර ගැනීමට හැකි ව තිබේ. මෙම කෘතියෙහි පරිවර්තන ස්වරූපය පිළිබඳ කෘතියෙහි පෙරවදනේ අදහස් දක්වන මහාචාර්ය

සරච්චන්ද්‍රයන් ගුණරත්න මහතා විසින් ව්‍යවහාර කරන ලද මටසිලිටු වාග්මාලාව වනාහි මේ නවකතාවෙහි ස්වභාවිකත්වයට අතිශයින් තුඩු දෙන්නකි. ඔහු විසින් උපයෝගී කොට ගෙන තිබෙන සරල, ඍජු, අලංකාර රචනා විලාසය වනාහි මුල් කතාවෙහි තාත්වික රස සමූහය උද්වහනය කිරීමෙහි ලා සමත්කම් දක්වන බව මුල් කෘතිය සසඳන්නෙකුට පෙනී යනු නිසැක ය[4]. යනුවෙන් සඳහන් කරයි.

උචිත අවස්ථා හා සිද්ධි පමණක් තෝරා ගැනීමෙහි ලා නවකතාකරුවා දක්වන අපූර්ව කුසලතාව සිත් ගන්නාසුලු ය. විවිධ සංකීර්ණ කථා ලක්ෂණ සමග බද්ධ කොට ප්‍රථම පුරුෂ සර්වවේදී දෘෂ්ටිකෝණයෙන් කතාව ඉදිරිපත් කර තිබේ. මෙම කතාව ගොඩනැගීමේ දී නවකතාකරුවා ගොඩනගන සංවාද මෙන් ම විඥානධාරා ආදිය කතා රසය තීව්‍ර කිරීමට සමත් වෙයි. සංකේත අන් කිසිදු උපක්‍රමයකටත් නොදෙවෙනි වන ආකාරයෙන් යොදා ගැනීම මගින් ධ්වනි පූර්ණ ගුණයක් කතාවට ප්‍රවේශ වී ඇත. උදාහරණ වශයෙන් බබෙහාමි ආරච්චිල මරාදැමීමේ චේතනාව සඟවාගත් සිළිඳු ඔහු පිටුපසින් හේනට යන අවස්ථාව දැක්විය හැකි ය.

> ''මී හරකා හරිම මෝඩයි. නැද්ද ආරච්චි ඌ හරියට ම මෝඩයි. ඌට පෙනෙන්නෙ නෑ. ඌට ඇහෙන්නෙ නෑ. ඌ ඔහේ මඩේ ලැගල ඉන්නවා. මිනිස්සු අවුරුද්දක් ගානෙ ඌ පස්සෙන් එළවනවා. අවුරුද්දෙන් අවුරුද්දට. ඒත් ඌ දන්නෙ නෑ. ඌට ඇහෙන්නෙ නෑ. ඌට පෙනෙන්නෙ නෑ. උඹ ඒ වග දන්නව ද? මං ඒ වග දන්නවා. මම දඩයක්කාරයෙක්. ඉතිං ඉතිං ඌට ළං වෙලා වෙඩි තියනවා. ඒ මේ හරියෙ ඉස්සර වෙලා ම ඩෝං ගාලා සද්දයක් ඇහුණා. ඌ කැලේ බිඳගෙන ගියා. උගේ ඇගේ ලේ පෙරී පෙරී. ඌ බයයි. හොඳට ම බයයි. ඌට තද වේදනාවයි. වේදනාවෙන් උගෙ කේන්තිය ඇවිස්සුණා. කේන්තියෙන් ආරච්චි ඌත් කපටියෙක් වුණා.''[5]

මෙහි දී කතුවරයා යොදා ගෙන ඇති මී හරකා සිළිඳුගේ ප්‍රවේගකාරී යටිසිත පිළිබඳ මනා සංකේතයකි.

මෙම අවස්ථා නිරූපණය හා බැඳුණු බස් වහර, චරිත, සිද්ධි, අවස්ථා හා මනෝභාව ආදිය සමඟ මනාව බද්ධ ව ප්‍රකාශන ස්වරූප

ප්‍රබල වී ඇත. එසේ ම තාත්වික නිරූපණයට වඩාත් සුදුසු භාෂාවක් පරිහරණය කිරීම හේතුවෙන් කතා රසය වර්ධනය වී ඇත. සෑම අවස්ථාවක දී ම කතාපුවතට ගෝචර වන ආකාරයේ කතා කලාවක් නිර්මාණය කර ගැනීම ද මෙම කෘතියෙහි ඇති විශේෂත්වයකි. එකී කතා කලාවට ගැලපෙන පරිදි ශිල්පධර්ම කලාත්මක සංයමයකින් යුතු ව පරිහරණය කිරීමට කතුවරයා වගබලාගෙන ඇත.

මෙම නවකතාවේ නවකතා කරුවා උසාවියේ දී සිදු වූ සිද්ධි නිරූපණ මගින් ගැමියාට නොතේරෙන බසකින් ඉටු වන සාධාරණය පවා එම නූගත් ජනතාවට අර්ථවත් නොවන බව අනාවරණය කරයි. සොබාදහම විසින් බැද්දේගම මිනිසුන්ගේ ජීවිතවලට ඇති කෙරෙන බලපෑම හේතුවෙන් මෙම මිනිසුන්ගේ ජීවිත අගාදයට පත් වූ ආකාරය නවකතාකරුවා නිරූපණය කරන සෑම පරිසර වර්ණනයකින් වුව ද පැහැදිලි වේ.

> ''ගම වනයෙන් ම පටෙන් ගැනී වනයෙන් ම කෙළවර වූයේ ය. වනය ගම වට කර ගෙන ගමට ඉහළින් ද වැඩෙමින් ගම තදබද කර ගෙන සිටියේ ය. ගෙමිදුල් හා එළිමහන් තැන් අකුල් කරගෙන මැටි ගෙවල් මිරිකාගෙන මංපෙත් අහුරාගෙන වනය හාත්පසින් ම වැඩුණේ ය. ගම සම්පූර්ණයෙන් ම වන බත් වීම වලක්වා ගත හැකි වූයේ අවුරුදු පතා කැති පොරෝවලින් පහර දී පහත් කර දැමීමෙනි.''[6]

නවකතාව වනාහි මනා ජීවිත විවරණයකි. එකී ජීවිත විවරණය සාර්ථක වීම සඳහා බලපාන මුඛ්‍ය අංගයක් වන්නේ, නවකතාවේ ඇතුළත් චරිතවල ක්‍රියාකාරීත්වයයි. බැද්දේගම නවකතාවේ ඇතුළත් චරිත එහි ක්‍රියාකාරිත්වය සඳහා ප්‍රබල සාධකයක් වී ඇත.

මෙම නවකතාවේ කතා නායකයා ලෙස නිරූපණය වන්නේ සිළිඳු ය. ඔහු සියලු බලවේගයන්ට නිහඬ ව මුහුණ දෙන පුද්ගලයා ය. ඔහු මෝඩයෙකු ලෙස සමස්ත නවකතාව පුරාම නිරූපණය වුව ද නවකතාව අගභාගයේ දී කතුවරයා ඔහුගේ යථාස්වභාවය පාඨකයාට හඳුනා ගැනීමට ඉඩ සලස්වයි. සෙසු චරිත නිරූපණයෙහි ලා කතුවරයා අනුගමනය කරන්නේ මධ්‍යස්ථ පරීක්ෂකයකුගේ ස්වභාවයයි. ඔහු සියලු චරිතයන්හි ක්‍රියාකාරීත්වය මැන බලා ඒ ඒ

අයගේ ජීවිත ස්වභාවයන් තුලනය කිරීමට අවකාශය සලසා ගනියි. නවකතාවේ ප්‍රධාන ම කාර්ය වනාහි චරිත නිරූපණයයි, යන්න පසක් කරන නවකතාකරුවා එහි සමාජ, සංස්කෘතික බලවේග සියල්ල එක ම තලයකට රැගෙන එන්නේ චරිතයන්හි ක්‍රියාකාරිත්වය සමඟ ය. එසේ ම නවකතාවේ සාර්ථකත්වය සඳහා එහි භාවිත බස්වහර ද සෘජු බලපෑමක් සිදු කරයි. මෙහි ඇතුළත් බස තත්කාලීන ගැමි වහරට වඩාත් සමීප ය. එය පරිසර වර්ණනා හා අවස්ථා නිරූපණ මෙන් ම පුද්ගල චරිතවල ස්වභාවය සමග ද මනාව බද්ධ වේ. පොදුවේ ගත් කල තත්කාලීන ලාංකේය ජන ජීවිතයෙහි වූ කටුකත්වය දේශපාලන යථාර්ථය මෙන් ම ජීවිත යථාර්ථය ද බැද්දේගම නවකතාව මඟින් මනාව නිරූපණය වේ.

**ආන්තික සටහන්:**

1. සරච්චන්ද්‍ර, ඊ. ආර්., (1985) **බැද්දේගම**, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම. 180 පි.
2. සරච්චන්ද්‍ර, ඊ. ආර්., (1985) **බැද්දේගම**, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
3. එම, 3 පි.
4. එම, 12 පි.
5. සුරවීර, ඒ. වී., (1988) **නවකතා නිර්මාණය හා අවබෝධය**. කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. 10, 11 පි.
6. Sunday Times, (1973) Produced by Lake House & the Associated News Papers of Ceylon Ltd.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

කුමාරසිංහ, කුලතිලක, (2005), **අද්‍යතන සිංහල නවකතා ද්විතීය භාගය**, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කුමාරසිංහ, කුලතිලක, (2004), **අද්‍යතන සිංහල නවකතා ප්‍රථම භාගය**, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

තිලකරත්න, මිණිවන් පී. (1989), **සියවසක පෙරළිය හා සිංහල නවකතාවේ පදනම**, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**බැද්දේගම**, (2001), අනුවාදය, ඒ. පී. ගුණරත්න, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

මැද්දේගම, උදය ප්‍රශාන්ත, (1999), **සියවසක සිංහල නවකතා**, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රාජකරුණා, ආරිය, (1998), **සාහිත්‍ය රසය හා නවකතා විචාරය**, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වික්‍රමසූරිය, සරච්චන්ද්‍ර, (2002), **සිංහල නවකතාවේ විකාශනය**, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වික්‍රමසූරිය සරච්චන්ද්‍ර, (1990), **සිංහල නවකතාවට මඟ පෑදීම**, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වික්‍රමසූරිය, සරච්චන්ද්‍ර, (1963), **නවකතා විවරණය**, කොළඹ, සී. ස. එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

සරච්චන්ද්‍ර, එදිරිවීර, (1999), **සිංහල නවකතා ඉතිහාසය හා විචාරය**, නුගේගොඩ, සී. ස. සරසවි පොත්හල.

සුරවීර, ඒ. වී. (2001), **නවකතා නිර්මාණය සහ අවබෝධය**, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනානායක ජී. බී. (1945), **නවකතා කලාව**, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.